VIDUS 2-3-11

# තාක්ෂණය හා තාක්ෂණ දැනුම ලබාදීම

**ඩී. එල්. ඕ. මෙන්ඩිස්**

ප්‍රාදේශීය සංවර්ධන අංශය, ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

තාක්ෂණ දැනුම ලබාදීම ඕනෑම ඌණ සංවර්ධිත රටක සංවර්ධන ව්‍යායාමයේ අතිශය වැදගත් අංගයකි. මෙය එක්සත් ජාතීන්ගේ හා වෙනත් මහා සභාවල සාකච්ඡාවන්ට භාජනය වී ඇත. විද්‍යාව හා ලෝක කටයුතු පිළිබඳ පග්වොෂ් සමුළුවෙහිදී මෙය අධ්‍යයනය කරනු ලැබූ අතර, එමගින් ජාත්‍යන්තර වශයෙන් තාක්ෂණික ඥාණය පතුරුවා හැරීම සම්බන්ධයෙන් ආචාර රීති මාලාවක්ද සම්පාදනය කරන ලදී.

සංවර්ධන ව්‍යාපෘතින්හි නව ආයෝජනයන් කිරීමේදී තාක්ෂණික ඥාණය එක් රටකින් තවත් රටකට ලැබේ. මෙම ආයෝජන පෞද්ගලික අංශයට අයත්විය හැකිය. විදේශීය හෝ දේශීය මෙන්ම විදේශීය මුදල් ආධාර සහිත වූ හෝ රහිත වූ හෝ රාජ්‍ය අංශයට ද අයත්විය හැකිය. විදේශීය ආධාර ද්වි පාර්ශ්වික හෝ බහු පාර්ශ්වික විය හැකි වන අතර ද්වි පාර්ශ්වික ආධාර විදේශ රාජ්‍යයකින්ද බහු පාර්ශ්වික ආධාර ලෝක බැංකුවෙන් හෝ ආසියාතික සංවර්ධන බැංකුවෙන් හෝ එක්සත් ජාතීන්ගේ ආයතනයන්ගෙන්ද ලැබේ. "නිල වශයෙන් ලබාදෙන සංවර්ධන ආධාර පමණක් 'ආධාර' වශයෙන් හැඳින්විය යුතුය. පෞද්ගලික මූල ධනය හා වාණිජමය හේතූන් නිසා නිල වශයෙන් ලබාදෙන ණය මුදල්වල ආධාර ස්වභාවයක් දක්නට නැත". [1] බහු ජාතික හෝ අන්තර් ජාතික සහයෝගය පෞද්ගලික විදේශ ආයෝජනයෙහි සුප්‍රකට අංගයකි.

ඉතිහාසයේ මූලාරම්භයේ පටන් සෑම ශිෂ්ඨාචාරයකම තාක්ෂණය පලපුරුද්දෙන් විකාශනය වූයේ, මිනිසා සිය සමීපස්ථ පරිසරයේදී සොබාදහම සමඟ ඇතිකරගත් අන්තර් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වශයෙනි. මෙම තාක්ෂණය මගින් මිනිසාට සිය මූලික අවශ්‍යතාවයන් පිරිමසාගැනීමට පුළුවන් විය. ආදි ශිෂ්ඨාචාරයෙහිදී මිනිසා සොබා දහම විමර්ශනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තාක්ෂණයෙන් වෙන්ව විද්‍යාව සංවර්ධනය විය. විද්‍යාව හා තාක්ෂණය තැනින් තැන ව්‍යාප්ත වූයේ ගවේෂණයේ හා ජන සංක්‍රමණයේ ප්‍රතිඵලයක් වශයෙනි. මෙහිලා වඩාත් උපකාරීවූයේ චුම්බක මාලිමාව සොයා ගැනීමයි. කාලාන්තරයක් මුළුල්ලේ නක්ෂත්‍රය හා ජ්‍යාමිතිය අවිච්ඡින්නව සංවර්ධනය වූ නමුදු එම දැනුම ධනවත් හා පූජක කොටස්වලට පමණක් සීමාවූ වරප්‍රසාදයක් විය.

දැනුම පෙරදිගින් අපරදිගට සංක්‍රමණය වූවාට පසුව අනපේක්ෂිත අවස්ථා කිහිපයක සංයෝගයේ ප්‍රතිඵලයක් වශයෙන් යුරෝපයේ විද්‍යා පුනර්ජීවනය ඇතිවිය. ඉන්පසු විද්‍යාව හා තාක්ෂණික ශිල්පය ශීඝ්‍රයෙන් යුරෝපයේ සංවර්ධනය විය. එසේ සංවර්ධනය වූයේද අන්‍යෝන්‍ය සම්බන්ධතාවයෙන් තොරව වෙන් වෙන් වශයෙනි. තාක්ෂණයේ වර්ධනය වෙළහෙළදාම නිසා සහ යටත් විජිත යුගයේ ආරම්භය නිසාද ඉක්මන් විය. පසුව ඇතිවූ ආගමික ප්‍රතිසංස්කරණය නිසා ඇතිවූ රෙපරමාදු ආචාර ධර්ම කරණ කොටගෙන හා පුරෝගාමීත්වයෙන් ලැබුණ අනුබලය නිසා එම වර්ධනය වඩාත් ඉක්මන් විය. ඉන්පසු කාර්මික විප්ලවය 18 වන ශතවර්ෂයේදී එංගලන්තයෙන් ආරම්භ වී යුරෝපයේ ශීඝ්‍රයෙන් පැතිර ගියේය. කාර්මික විප්ලවය හා ධනවාදී නිෂ්පාදන ක්‍රමයේ උදවද එකවිටම පාහේ සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තාක්ෂණික ශිල්පයේ ස්වරූපයෙන් පැවති මූලධන සමාහරණයෙන් යුක්තවූද, ශ්‍රම විභජනයෙන් යුක්තවූද, කර්මාන්තශාලා නිෂ්පාදන ක්‍රමය විකාශනය විය. මෙයින් මධ්‍යගත මහා පරිමාණ නිෂ්පාදන බෙදහැරීම් හා අලෙවි ක්‍රම ඇතිවූ අතර ඒවා කාර්මික සංවර්ධනය හා කර්මාන්ත නවීකරණය හා සමඟ තුල්‍යාර්ථක බවට පත්විය. නවීන කර්මාන්ත නාගරික මධ්‍යස්ථානවලට සීමාවූ අතර ඊට මුල්වූ පරම්පරාගත කුඩා පරිමාණ කර්මාන්ත එම පරම්පරාවන්ටම ආවේණිකව පැවතුණි. අද දියුණු රටවල මෙම කර්මාන්ත අභාවයට පත්ව ඇති නමුදු, සංවර්ධිත ලොවෙන් ලැබගත් තාක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස නවාංශ දක්නට ඇති සංවර්ධනය වන්නාවූ රටවල බහුතර ජනතාව මෙකී පරම්පරාගත කර්මාන්ත නිසා ජීවිකාව කරගෙන යති.

දහනව වන සියවසේදී එක්සත් ජනපදයේ කාර්මික විප්ලවය හටගත් අතර එහි ලක්ෂණයක් වූයේ කෘෂිකර්මය සඳහා යන්ත්‍ර සූත්‍ර බහුල ලෙස යොදගැනීමය. යුරෝපයේ මෙන් තාක්ෂණයේ සංවර්ධනය උදෙසා විද්‍යාත්මක ක්‍රම යොදගැනීම සිදුවූයේ පසුවය. තාක්ෂණයේ විකාශනය ආරම්භයේදී අත්දැකීම් මත රඳා පැවතිණි. අද නවීන කෘෂිකාර්මික සංවර්ධනය පදනම්ව ඇත්තේ විද්‍යාත්මක පර්යේෂණය මතය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදනය හා ඉපැයුම වැඩිකරගැනීමට අධික යෙදවුම් ප්‍රයෝජනයට ගැනීම සිදුවිය. මෙම නවීන කෘෂිකාර්මික ශිල්පක්‍රම සංවර්ධනය වන්නාවූ රටවලට ලබාදෙන අතර ඇතැම්විට ඒවා මෙම රටවල පරම්පරාගත කෘෂිකාර්මික ජනතාව පිටද පටවිනු ලැබේ.

ඉදිකිරීම් අංශයෙන්ද නවීන තාක්ෂණය සංවර්ධනය වන්නාවූ රටවලට ලැබේ. ශ්‍රී ලංකාවේ යෝධ ඉදිකිරීම් උපකරණ මුල්වතාවට පාවිච්චිකරනු ලැබුයේ දෙවන ලෝක සංග්‍රාමයට පෙර පැරණි වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහාය. යුද්ධයෙන් පසු මෙම ප්‍රතිසංස්කරණ කටයුතු වල වේගය තීව්‍ර විය. පස් පෙරලන යෝධ යන්ත්‍ර හා දැවැන්ත උපකරණ භාවිතයෙන් ඕනෑම ගඟක වේලි බැඳිය හැකිය. මේ නිසා වාරිමාර්ග හා බහු කාර්ය ව්‍යාප්ති නිර්මාණය නව මගකට යොමු වී ඇත. මෙම නව මග මධ්‍යගත, මහා පරිමාණ ක්‍රමයක් වශයෙන් දැක්විය හැකි වන අතර එය විසිරීගිය, එකක් නැතිව අනිකක් පවත්වාගෙන යා නොහැකි කුඩා පරිමාන ක්‍රම පදනම් වූ පැරණි වාරිමාර්ග ක්‍රමවලට වඩා හාත්පසින්ම වෙනස්ය.

බටහිර ලොව කාර්මික විප්ලවයට පසුව සංවර්ධිත රටවල නිෂ්පාදන ගබඩා හා බෙදහැරීම් කටයුතු පිළිබඳ මහා පරිමාණ ක්‍රම අතිශයින් ජනප්‍රිය වූ බව පෙනේ. මෙබඳු රටවලට විසිරී ගිය කුඩා පරිමාණ ක්‍රම මුළුමනින්ම පාහේ අභාවයට පත්ව ඇත. සංවර්ධිත රටවල මහා පරිමාණ මධ්‍යගත ක්‍රම, සංවර්ධනය වන්නාවූ රටවලද අනුකරණය කිරීමට නැඹියාවක් ඇති අතර තාක්ෂණික දැනුම පැතිරීයාම මීට තවත් අනුබලයක්ව පවතී. එසේ වුවද මහා පරිමාණ මධ්‍යගත ක්‍රම හා තරඟ කළ හැකි කාර්යක්ෂම කුඩා පරිමාණයේ විමධ්‍යගත නිෂ්පාදන හා වාණිජ ආයතන පහළ වී ඇත්තේ අහම්බෙන් යයි කිවහැකි වුවද මෑතකදී මේ තත්ත්වය වෙනස්වී ඇත. යෝධ බහු ජාතික ආයතන ලොව නොයෙකුත් රටවල කුඩා කර්මාන්තශාලා ගණනාවකම ආයෝජනය කිරීම නිදසුනකි.

මෙම ක්‍රම විකාශනයේ වැදගත් අංගයක් වශයෙන් කෘත්‍රිම ක්‍රමවලට මුල්වූ ඒ ඒ පරිසර පද්ධතීන් එකිනෙක සංසන්දනය කර බැලීම වැඩදායකය. පෘථිවියේ සමශීතෝෂ්ණ ප්‍රදේශවල පරිසර පද්ධතීන් ඉතා විශාල වුවද වර්ගයෙන් හා විවිධත්වයෙන් සීමිත බව කෙටියෙන් සඳහන් කළ හැකිය. එහෙත් සර්ම කලාපීය රටවල විශේෂයෙන්ම උෂ්ණ තෙත් කලාපීය රටවල පරිසරයේ විවිධත්වයක් හා ගැටළු සහිත අන්‍යෝන්‍ය බලපැවැත්මක් ද දක්නට ඇත. උදාහරණයක් වශයෙන් සමශීතෝෂ්ණ කලාපයේ පතනශීල වනාන්තර හා කොනිෆරස් වනාන්තර ඇතද මෙබඳු අති විශාල වනාන්තරවල දක්නට ඇති වෘක්ෂලතා හා සත්ව වර්ග අල්පය.

අනික් අතට උෂ්ණ කලාපයට අයත් කුඩා ප්‍රදේශයක වුවද නානා විධි වෘක්ෂලතා හා සත්ව වර්ග දක්නට ඇත. (අප රටෙහි සිංහරාජ අඩවිය මීට කදිම නිදසුනකි.) මෙයින් පැහැදිලිවන කාරණය නම් විකීර්ණ අන්‍යොන්‍ය බලපැවැත්මෙන් යුතු කුඩා පරිමාණ ක්‍රම උෂ්ණ කලාපීය පරිසර පද්ධතිය තුළ විකාශනය වූ බව හා මධ්‍යගත මහා පරිමාණ ක්‍රම සමශීතෝෂ්ණ කලාපීය පරිසර පද්ධතිය තුළින් ඇතිවූ බවත්ය. එබැවින් සංවර්ධිත රටවලින් සංවර්ධනය වන්නාවූ රටවලට තාක්ෂණික දැනුම පතුරුවා හැරීමේදී එයට නෛසර්ගික විරෝධතා හරස්වන බවක් පෙනේ. මෙම විරෝධතාවයට හේතුව පහත දැක්වෙන ප්‍රකාශයෙන් විස්තර කෙරේ. ''තාක්ෂණය ජන කාණුවක් බඳුය — එය ජනිත කළ සමාජයේ රීතිය ඒ තුළට කා වැදී ඇත.'' 'සමාජය' යන වචනය ට 'පරිසර පද්ධතිය' යන වචනය ආදේශ කිරීමට අප කැමතිය.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන්නාවූ රටක, නවීන මධ්‍යගත මහා පරිමාණ ක්‍රමය හා පරම්පරාගත විසිරී ගිය, කුඩා පරිමාණ ක්‍රමය වෛකල්පිත ක්‍රම වශයෙන් නොසැලකිය යුතුය. ඒවා තරඟකාරී ක්‍රම වශයෙන් නොව අන්‍යොන්‍ය අනුපූරක ක්‍රම වශයෙන් උපයෝගී කරගත යුතුය. ක්‍රම දෙක කවර අනුපාතයකින් උපයෝගී කරගත යුතුද යන්න ඒ ප්‍රස්තුත අවස්ථාව මත රඳා පවතී. එමෙන්ම ඒ ඒ ව්‍යාපෘති සලකා බැලිය යුත්තේ අදාළ නිෂ්පාදන සාධක ආශ්‍රයෙනි.

ඕනෑම අර්ථ ක්‍රමයක විශේෂයෙන්ම සංවර්ධනය වන්නාවූ අර්ථ ක්‍රමයක ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික වශයෙන් නිෂ්පාදන අංශ තුනකදී රැකියා ඇතිවේ. ප්‍රාථමික අංශයේ නියම නිෂ්පාදන කටයුතු කෘෂිකාර්මික රැකියා හා ආකර කර්මාන්තයට අයත් රැකියා මගින් ඉටුවේ. ද්විතීයික අංශයේ භාණ්ඩ සැකසුම හා නිෂ්පාදන යද තෘතීයික අංශයේ භාණ්ඩ බෙදුහැරීම හා අදාළ වෙනත් කටයුතු සහ සේවා සැපයුම ආශ්‍රිත වාණිජ කටයුතුද දක්නට ඇත. සෑම නිෂ්පාදන අංශයකම සුළු සේවක ශ්‍රේණිය,ලිපිකරු ශ්‍රේණිය හා කළමනාකරණ ශ්‍රේණිය යනුවෙන් රැකියා මට්ටම් තුනක් දක්නට ඇත. කලින් සඳහන් නිෂ්පාදන අංශ තුනෙහි හා රැකියා මට්ටම් තුනෙහි නියුතු සේවකයින්ගේ සාපේක්ෂක සංඛ්‍යාව තුළින් අර්ථ ක්‍රමය කෙතෙක්දුරට සංවර්ධනය වී ඇද්දැයි දැනගත හැකිය. සංවර්ධිත රටවල ප්‍රාථමික නිෂ්පාදන කටයුතුවල නියුතු සේවක සංඛ්‍යාව ඉතා අල්පය. උපයෝගී කරගන්නා තාක්ෂණයන්ගේ අධි නිෂ්පාදන ධාරිතාවය හේතුකොටගෙන සුළු සේවකයන්ගේ ගණනද ඉතා අඩුවේ. ශ්‍රී ලංකාව බඳු සංවර්ධනය වන්නාවූ දුප්පත් රටවල පරම්පරාගත ශිල්ප ක්‍රම භාවිත කිරීමේදී ප්‍රාථමික නිෂ්පාදන අංශයේදී මෙන්ම සුළු සේවක මට්ටමෙහිදීද වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවනු ලැබේ.

මූලධනය, ශ්‍රමය හා භූමිය නිෂ්පාදනයේ මූලික සාධක වශයෙන් සැලකේ. භූමිය යනුවෙන් අදහස්වනුයේ සම්පත්ය. ඉංජිනේරු සැලසුම් කිරීමේදී මුදල්, සේවක පිරිස්, ද්‍රව්‍ය, යන්ත්‍ර, ක්‍රම හා කළමනාකාරිත්වය ගැන සඳහන් වේ. තාක්ෂණය මූල ද්‍රව්‍ය, යන්ත්‍ර, ක්‍රම හා කළමනාකාරිත්වය යන අංශවලින් සමන්විත වන බව හා මූලධනය, ශ්‍රමය හා තාක්ෂණය නිෂ්පාදන සාධක වශයෙන්ද හැඳින්විය හැකිය. මූල ද්‍රව්‍ය හා යන්ත්‍රසූත්‍ර ආදිය තාක්ෂණික දෘඩ භාණ්ඩ ලෙසද, ශිල්ප ක්‍රම හා කළමනාකරණය ආදිය තාක්ෂණික මෘදු භාණ්ඩ වශයෙන්ද තාක්ෂණය තවදුරටත් අංශ දෙකකට බෙදිය හැකිය.

සංවර්ධනයේ ඕනෑම අවස්ථාවක අර්ථ ක්‍රමයේ නොයෙකුත් අංශවල මූලධන, ශ්‍රමය හා තාක්ෂණයේ සංකලනයක් දක්නට හැකිය. සංවර්ධනය හිතාමතා වේගවත් කළ විට, නිෂ්පාදනය වැඩිකිරීම සඳහා මූලධනය, ශ්‍රමය හා තාක්ෂණයේ ''ස්වාභාවික'' සංකලනයද හිතාමතාම වෙනස් කළ යුතුය. තාක්ෂණිකතාරණය විමසා බැලිය යුත්තේ මෙබඳු වාතාවරණයක් යටතේය.

මෙරට තාක්ෂණිකතාරණය බොහෝවිට උපයෝගී කරගනු ලබන්නේ නීතිගත සංස්ථා අංශයේ නව නිෂ්පාදන ඒකක පිහිටුවීම සඳහාය. නව කර්මාන්ත ශාලාවක් පිහිටුවීමේදී දෘඩ හා මෘදු භාණ්ඩ කොටස්වලින් යුතු තාක්ෂණයක් සමගම පුහුණු සේවක කොටස් (ශ්‍රම සාධකය) හා මූලධනයෙන් කොටසක්ද එතෙරින් ලැබේ. මෙබඳු ව්‍යාපෘතිවල පරමාර්ථය වනුයේ, ආයාතික ශ්‍රමය හා මූලධනය වෙනුවට ටික කලකට පසු දේශීය සම්පත් යොදා ගැනීමය. එසේවුවද, ක්‍රියාත්මක කිරීමේදී සාධක සංකලනයේ දක්නට ඇති තවත් අංගයක් ඇත. නව කර්මාන්තශාලාව පිහිටුවීමට පෙර, එහි නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත භාණ්ඩ එම තත්ත්වයෙන් හෝ ඊට බාල තත්ත්වයකින් හෝ නිමවූ පරම්පරාගත දේශීය නිෂ්පාදනයක් මෙහි පැවතුණා විය හැකිය. නව ආයෝජනයන්ගෙන් පරම්පරාගත කර්මාන්තවලට ඇතිවන බලපෑම සලකා බැලීම වැදගත් වේ. ජාතික ක්‍රම සම්පාදකයන් එබඳු පරම්පරාගත කර්මාන්තයක පැවැත්ම ගැන දැනගතහොත් තාක්ෂණ දැනුම පිටරටවල පවතින ආකාරයෙන්ම මෙහි ගෙනඒමට මත්තෙන් එබඳු කර්මාන්තවල ශක්‍යතාවය හා ඒවා අභිවර්ධනය කිරීමට ඇති හැකියාවද ගවේෂණය කළ යුතුය. මෙය කර්මාන්ත අංශයට හා කෘෂිකාර්මික අංශයටද පොදුවේ අදාල වන්නකි.

එසේවුවද කර්මාන්ත අංශයේ බොහෝ අවස්ථාවලදී මෙය ක්‍රියාත්මක නොවී ඇති බව අපට පෙනේ. උසස් තත්ත්වයෙන් යුතු ආයාතික නිකර නිෂ්පාදන සමඟ තරඟ කිරීමට සිදුවූවද, පරම්පරාගත දේශීය ශිල්පීන් නිපදවූ උදලු හා වෙනත් කෘෂිකාර්මික ආම්පන්න හා දිග සොයිබ, සරනේරු වැනි ගොඩනැගිලි උපකරණ වර්ග 46 ක් නිපදවීම සඳහා තාක්ෂණික දැනුම ලබාගැනීමෙන් රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව පිහිටුවන ලදී. දේශීය ලී මෝල් හා වඩුවැඩ පළවල්වල නිෂ්පාදන ධාරිතාවය ගැන නොතකා, තේ පෙට්ටි හා සැහිලැලි බඳු සැකසූ දැව නිෂ්පාදන නිපදවීම උදෙසා තුනීලෑලි සංකීර්ණයක්ද සාලාව නම් ස්ථානයේ පිහිටුවා ඇත.

කෘෂිකාර්මික අංශයෙහිද තාක්ෂණතාරණය සංවර්ධන සැලැස්මේ සාමාන්‍ය අංශයක් බවට පත්ව ඇති අතර ආධාර වැඩසටහන් යටතේ තාක්ෂණ ආධාර රාශියක් ශ්‍රී ලංකාවට ලැබී ඇත. උපරිම යෙදවුම් – උපරිම නිපැයුම් තාක්ෂණ ක්‍රමය වශයෙන් හැඳින්වෙන කෘෂි විප්ලව තාක්ෂණය ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. අධික අස්වැන්නක් ලබා දෙන වී, තිරිඟු හා ඉරිඟු වර්ග බෝකළත් ඒවාට අධික ලෙස අවශ්‍ය පොහොර හා කෘමිනාශක ද්‍රව්‍ය සංවර්ධිත රටවල පහසුවෙන් ලබාගත හැකි වූවත් සංවර්ධනය වන රටවල මේවා දුලබ සම්පත් වේ. සංවර්ධනය වන්නාවූ රටවලට අවශ්‍යව ඇත්තේ අපේ ස්වාභාවික සම්පත්වලට ගැලපෙන ප්‍රශස්ත යෙදවුම් – ප්‍රශස්ත නිපැයුම් තාක්ෂණික ශිල්ප ක්‍රම වේ.

''උචිත තාක්ෂණය'' යන්නෙන් වඩාත් පුළුල් වශයෙන් අදහස්වනුයේ ලබාගත හැකි සම්පත්වල ප්‍රශස්ත උපයෝගීතාවය

අදහස් කෙරෙන ප්‍රශස්ත තාක්ෂණයකි. සංවර්ධනය වන්නාවූ රටවලට අවශ්‍යවන මෙබඳු තාක්ෂණ ක්‍රමය සංවර්ධිත රටවල තාක්ෂණයන් මෙන් සංකීර්ණවූද, වැඩි මූලධනයක් අවශ්‍යවන්නා වූද මහා පරිමාණ ගණයට අයත් වන්නාවූද, එකක් නොවිය යුතුය. පැරණි තාක්ෂණයන් මෙන් ශ්‍රමය අධිකසේ අවශ්‍ය නොවන්නාවූ "මධ්‍යම ප්‍රතිපදාවට" අයත් තාක්ෂණ ක්‍රමයක් අපට අවශ්‍යව ඇත්තේය. කලින් විස්තර කළාක් මෙන් ලබාගත හැකි සම්පත් ප්‍රශස්ත ලෙස පාවිච්චියට ගන්නා ප්‍රශස්ත තාක්ෂණයක් වශයෙන් මධ්‍යම ප්‍රතිපද තාක්ෂණය සැලකිය නොහැකිබව මෙහිදී සඳහන් කළ යුතුය.

"මධ්‍යම ප්‍රතිපද" තාක්ෂණය යන නිර්වචනය පළමුවෙන්ම ප්‍රචාරයට පත්කරනු ලැබුවේ 1965 දී ලන්ඩන් නුවර මධ්‍යම ප්‍රතිපද තාක්ෂණ සංවර්ධන කණ්ඩායම පිහිටවූ ආචාර්ය ඊ. එෆ්. ෂූමාකර් මහතා විසිනි. මධ්‍යම ප්‍රතිපද තාක්ෂණ සංකල්පයට විවිධ උප ලක්ෂණ ආරෝපණය කර ඇත. එහි ප්‍රභවය ගාන්ධි හා ආනන්ද කුමාරස්වාමිගේ දර්ශනයෙහි දක්නට ඇති බවද, බුද්ධාගමෙන් ආගමික ආශිර්වාදය ලැබී ඇති බවද දක්වේ. සංවර්ධනය වන්නාවූ රටවලට ගැලපෙන අයුරින් සංවර්ධිත රටවල නිර්මානය කරන ලද මධ්‍යම ප්‍රතිපද තාක්ෂණ ක්‍රම දැන් අනිකුත් තාක්ෂණ ශිල්පීය දැනුම මෙන්ම, සංවර්ධනය වන්නාවූ රටවල පතුරුවා හරිනු ලැබේ.

ඒ අතරතුර, සංවර්ධනය වන්නාවූ රටවල සංවර්ධන ව්‍යායාමය තාක්ෂණ ක්‍රම තෝරා ගැනීමෙහිලා දුෂ්කරතාවයකට මුහුණ පා ඇත. සංවර්ධනය වන්නාවූ රටවල ව්‍යාපෘතීන් සැලසුම් කිරීම, නිර්මානය කිරීම හා ඉදිකිරීම් සඳහා 'තාක්ෂණ ක්‍රම' තෝරා ගන්නා ක්‍රම සම්පාදකයන් කෙරෙහි නිරන්තරයෙන් ලෝකයේ දියුණු සමාජවල චින්තන රටාව තදින් බලපවත්වන බව නොරහසකි. එබඳු වාතාවරණයක් යටතේ මධ්‍යම ප්‍රතිපද තාක්ෂණ ක්‍රමයක් තෝරාගැනීම දුෂ්කර වන අතර උචිත තාක්ෂණ ක්‍රමයක් සැලසුම් කිරීම අත්‍යන්තයෙන්ම දුෂ්කර වන්නේය. එබැවින් ශ්‍රී ලංකාවට සුදුසු තාක්ෂණ ක්‍රම සැලසුම් කිරීමට හා පිටරටින් තරණය කරන ලද තාක්ෂණ ක්‍රම තෝරා ගැනීමට පෙර, සංවර්ධිත ලෝකයේ චින්තන රටාව නිසා අප සිත්වලට කාවැදී ඇති දුර්මත ඉවත්කිරීම අත්‍යවශ්‍ය වන්නේය.

**ආශ්‍රිත ග්‍රන්ථ:**


1. Partners in Development. Report of the Commission on International Development (1969) Praeger Publishers.


විද්‍යා හා තාක්ෂණික ප්‍රතිපත්තියේ තවත් වැදගත් අංගයක් නම්, පර්යේෂණ ප්‍රතිඵල කර්මාන්ත අංශයට ලබාදීමද ඇතුළුව විද්‍යාත්මක පර්යේෂණයෙහි ජාත්‍යන්තර සහයෝගයයි. ජාත්‍යන්තර මට්ටමෙහිදී විද්‍යාත්මක ශ්‍රමය බෙදගනිමින් පර්යේෂණ පිළිබඳව විශේෂ දැනුම ලබාගැනීම හා සහයෝගය, ජාතික මට්ටමකදී විද්‍යාව හා තාක්ෂණය සංවර්ධනය කිරීමේ එක් පූර්ව කොන්දේසියක් වේ. ජාත්‍යන්තර සහයෝගය ආරම්භ විය යුත්තේ එක්වී වැඩ කළයුතු ප්‍රමුඛත්ව ක්ෂේත්‍ර නිර්ණය කිරීම, ක්‍රියාකාරී වැඩ සටහනක් සම්පාදනය කිරීම හා වඩාත් ඵලදායී සහයෝගී උපක්‍රම තෝරාගැනීමෙනි. තොරතුරු හා විද්‍යාඥයන් හුවමාරු කරගැනීම, ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතීන් හා විද්‍යාත්මක සේවා පිරිස් පුහුණු කරවීම සඳහාද විද්‍යාත්මක පහසුකම් සලසාදීම සඳහාද ඔවුනොවුන්ට සහයෝගය ලබාදීම යනාදිය මෙහි දෙවනුව සඳහන්කළ කාරණයට අදාළ වන්නේය.

**යුනෙස්කෝ සහරාව**